සැ. යු. — 2014.02.21 දින පළ වූ අංක 1,851 දරන ගැසට් පත්‍රයේ I:III සහ IV (අ) කොටස් පළ නොවීය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,852 - 2014 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා - 2014.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 396 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 402 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 403 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මාර්තු මස 21 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මාර්තු මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව

ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාවේ 2013.01.01 දිනට අනුමත වූ විදුලි කාර්මික තනතුරු 01ක් සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් 2014.03.14 වැනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

*උපලේඛනය*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | 01 | (අංක 6/2006)IV දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ PL-2-2006A රු.12,210-10x130-10x145 10x160-12x170-රු.18,060 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර (111 පන්තියට නියමිත වැටුප් පරිමාණයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |

*02. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

(අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) හෝ 3 වන මට්ටමේ (NVQ3) සහතිකය ලබා තිබීම;

*හෝ*

(ආ) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

*හෝ*

(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;

*හෝ*

(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහිතකය ලබා තිබීම.

(II) *පළපුරුද්ද*

අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක /රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර දෙකකට වැඩි කාලයක් සේවය කර තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

*03. පොදු කොන්දේසි :-*

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරු/කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
3. අයදුම්කරු/කාරිය ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 05ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය.
4. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
6. අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
02. චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු හා අනත්දරු /වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය;
03. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර එම කාලය තුළ සිය රාජකාරි වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේනම් පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ;
04. මෙම තනතුර පළාත් රාජ්‍ය සේවයට අයත්වන අතර, පත්වීම අදාළ පළාත් පාලන ආයතනයට පමණක් සීමාවේ.

*05. බඳවා ගැනීමේ ක්‍රමය :-*

01. අවශ්‍යතාවය මත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
02. අයදුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු වන අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය. එයට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්/තැපැල් ස්ථානාධිපති විසින් නිකුත් කළ හැඳුනුම්පත හෝ වලංගු ගමන් බලපත්‍රයක් පරීක්ෂණ අවස්ථාවට ඉදිරිපත් කළ යුතු ය.

i. උප්පැන්න සහතිකය ,
ii. අධ්‍යාපන සහතික,
iii. හැඳුනුම්පතේ පිටපතක්,
iv. තම පදිංචිය සහතික කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය, (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනු අත්සන් කළ)
v. මැතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතු ය.
vi. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)
vii. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වන්නේ නම් සේවා සහතිකය,
viii. තනතුරට අදාළ ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා සහතිකය.

03. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

06. *අයදුම්පත් :-*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2014.03.14 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, ලග්ගල පල්ලේගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ විදුලි කාර්මික තනතුර ලෙසින් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

2. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා දැන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ සියලු බලතල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ලේකම්,
ප්‍රාදේශීය සභාව, ලග්ගල පල්ලේගම.

2014 පෙබරවාරි මස 06 වැනි දින,
ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව***

*ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික තනතුර සඳහා වූ අයදුම්පත්‍රය*

01. i. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.
ii. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
02. පෞද්ගලික ලිපිනය :————.
03. *(අ)* උපන්දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
*(ආ)* 2014.03.14 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————.
05. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
07. දිස්ත්‍රික්කය :————.

08. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
09. විවාහක ද/අවිවාහක ද යන වග :——————.
10. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද ? (පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචියෙන් ද යන්න සඳහන් කරන්න) :——————.
11. අධ්‍යාපන සුදුසුකම් :——————.

අ.පොස. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය:——————. විභාග අංකය:——————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6.<br>7.<br>8.<br>9.<br>10. | | |

13. ශිල්පීය නිපුණතා :——————.
ලබාගත් ආයතනය :——————.
ලබාගත් සහතිකය :——————.
14. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————.
15. ඔබට උසාවියකින් දඬුවම් පවරා තිබේ ද ? :——————.
16. එසේ නම් දඬුවමේ ස්වභාවය :——————.
17. දැනට ප්‍රාදේශීය සභාවේ සෙවේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :——————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසුව දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

——————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

18. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

——————.
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

***සටහන*** : (සහතික කරන අය සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, නොතාරිස්වරයෙකු හෝ වසරකට රු. 2,40,360 ට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු ද විය යුතු ය.

19. *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය/මෙනවිය මෙම ප්‍රාදේශීය සභාවේ ......................... දින සිට ස්ථිර/දෛනික/අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු බව ද සහතික කරමි.

——————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :——————.
පදවි නාමය :——————.
ලිපිනය :——————.
දිනය :——————.

02-665

## පන්විල ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පන්විල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතිපත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2014.03.14 දිනට පෙර “ලේකම්, පන්විල ප්‍රාදේශීය සභාව, පන්විල” යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ කොටසේ පන්විල ප්‍රාදේශීය සභාවේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය. (පන්විල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, ආදේශක සේවකයන්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

### උපලේඛනය

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|
| විදුලි කාර්මික iii පන්තිය | 01 | 06/2006 iv- PL-2 රු.12,.210-130x10-145x10-160x10-170x12-රු.18,060 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග විෂයයන් හයකින් සාමාර්ථ ලබාගැනීම. |

*(අ)* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වැනි මට්ටමේ (NVQ2) හෝ 3 වැනි මට්ටමේ (NVQ3) සහතිකය ලබා තිබීම;

*හෝ*

*(ආ)* කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

*හෝ*

*(ඇ)* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

*හෝ*

*(ඈ)* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

*(ඉ)* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

*හෝ*

*(ඊ)* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහිතකය ලබා තිබීම;

හා

වීථි ලාම්පු සවිකිරීම පිළිබඳව විදුලිබල මණ්ඩලයෙන් හෝ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද පිළිබඳ සහතිකයක් ලබා තිබීම හෝ විදුලිබල මණ්ඩලය හෝ පෞද්ගලික අංශයේ අදාළ ක්ෂේත්‍රයේ, සේවය කර ඇති අය කෙරේ ප්‍රමුඛත්වයක් දක්වනු ලැබේ.

*02. බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :-*

1. අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය ;
2. අයදුම්කරුවන් පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය;
3. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය;
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 නොවැඩි විය යුතු ය. (පන්විල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ස්ථිර/අනියම්/ආදේශක මත සේවයේ යෙදී සිටින අයට උපරිම වයස අදාළ නොවේ.)
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය ;
6. දැනටමත් පන්විල ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කෙරේ.

*03. බඳවා ගැනීමේ ක්‍රමය :-*

01. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රථිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.

*04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

01. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය ;
02. පත්වීම් දින සිට වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ ;
03. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන නියෝග වලට ද, මධ්‍යම පළාත් සභාව හෝ පළාත් පාලන කොමසාරිස් හා පන්විල ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතු ය;
04. මෙම බඳවා ගැනීමේ නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද පන්විල ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ;
05. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය;
06. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළහොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු ය;
07. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය පන්විල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය ;

*05. ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන :-*

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ;
(ii) අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ;
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්; (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබාගත් එකක් විය යුතු ය)
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික.

දෙමළ හා ඉංග්‍රීසි පරිවර්ථනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතු ය.

එම්. ඒ. දුර්ගා පෙරේරා,
ලේකම්,
පන්විල ප්‍රාදේශීය සභාව,
පන්විල.

2014 පෙබරවාරි මස 10 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම*

*පන්විල ප්‍රාදේශීය සභාව*

....................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම :————————.
 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————.
02. ස්ථිර පදිංචි ලිපිනය :————————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
05. උපන් දිනය ඃ අවුරුද්ද :————————. මාසය :————————. දිනය :————————.
06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :————————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
08. විවාහක/අවිවාහකබව :————————.
09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උත්පත්තියෙන් ද ? ලියාපදිංචියෙන් ද යන වග :————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————————.
 අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය:————————. විභාග අංකය:————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | 5.<br>6.<br>7.<br>8. | |

11. (1) වෙනත් සුදුසුකම් :————————.
 (2) වෘත්තීය සුදුසුකම් :————————.
 (3) සේවා පළපුරුද්ද :————————.

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :————————.

 ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක යන වගද ? :————————.

 එම තනතුරට පත්වූ දිනය :————————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :————————.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

මෙම ඉල්ලුම්කරු වන ............................... මෙම ආයතනයේ .......................... වශයෙන් සේවය කරනු ලබයි. ඔහු සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————.
(නිල මුද්‍රාව තැබිය යුතු ය.)

02-843

# පළාත් පාලන නිවේදන

## අකුරණ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24(2) වගන්තිය යටතේ කරන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් මාර්ගය අකුරණ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාල ඉඩම් වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයක් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තියේ ප්‍රකාරව ක්‍රියාකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2013 මාර්තු මස
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

### උපලේඛනය

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග* | *පළල* | *මායිම්* |
|---|---|---|---|---|
| 01 | නීරුල්ල මල්වානහින්න හරස් පාර | අඩි 550 | අඩි 08 | *වම්පස:-*<br><br>මල්වානහින්න අකුරණ ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වී එම්. බී, එම්. මල්වාන් මයාගේ ඉඩමට, එන්. පී. එන්. බසීර් මයාගේ ඉඩමට, පී. එම්. අස්වර් හාරියාන් මයාගේ ඉඩමට සහ කේ. එම්. ෆයාස්ගේ ඉඩමට අයත්වන මායිම වේ.<br><br>*දකුණුපස :-*<br>මල්වානහින්න අකුරණ ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වී එම්. එස්. ජිෆ්රියා උම්මා මියගේ ඉඩමට, එම්. එස්. ජෙනෙත් උම්මා මයාගේ ඉඩමට, එච්. එම්. එම්. ඉස්මයින් මහතාගේ ඉඩමට, පී. එම්. එස්. ෆාරියා මයාගේ ඉඩමට, එම්. පී. එස්. හරෝස් මයාගේ ඉඩමට, පී. එම්. අජිල් උම්මා මියගේ ඉඩමට, එම්. අයි. එම්. ඉස්මයිල් මයාගේ ඉඩමට, අයි. එම්. එම්. නසීර් මයාගේ ඉඩමට සහ එස්. ඒ. ඒ. මජිඩ් මයාගේ ඉඩමට අයත් වන මායිම් වේ. |

02-764

---

## හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු (262 වන අධිකාරය වූ) 1952 අංක 06 දරන පළාත්පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාත් පාලන විෂය භාර අමාත්‍ය ශෂින්ද්‍ර රාජපක්ෂ මැතිතුමා විසින් 2013 ජුනි මස 28 වන දින අංක 1816/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා විසිතුන හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ 2014.01.30 වන දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී ඒකමතිකව පිළිගෙන එකී අතුරු ව්‍යවස්ථා විසිතුන මෙම සභාවට වැළඳ ගැනීම සුදුසු බව අනුමත කළබව මෙයින් නිවේදනය කරමි.

ආර් එම්. ධනරත්න,
සභාපති,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව.

2014 ජනවාරි මස 30 වැනි දින,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව.

02-834

# විවිධ දැන්වීම්

## බණ්ඩාරවෙල මහ නගර සභාව

### නගර ශාලා සහ ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා යටතේ ගාස්තු පැනවීම

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, අංක 541/17-1989 ජනවාරි මස 20 වැනි දිනැති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* VI(ආ) වැනි කොටසේ ප්‍රසිද්ධ කරනු ලැබුවා වූ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මාලාවේ LVII වන කොටසේ නගර ශාලා හා ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල අංක 02 අතුරු ව්‍යවස්ථාවේ (අ), (ආ) හා (ඇ) යටතේ විස්තර වන පරිදි බණ්ඩාරවෙල මහ නගර සභාවේ නගර ශාලාව වෙන් කරවා දීමේදී අයකරනු ලබන ගාස්තු වලට අමතරව 2013.10.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි නගර ශාලාවේ ප්‍රේක්ෂකාගාරයේ තබා ඇති පුටු වෙනුවෙන් උපරිම වශයෙන් පුටු 300ක් සඳහා පමණක් එක් පුටුවකට රු. 5 00 ක් බැගින් වූ අමතර ගාස්තු මුදලක් අය කිරීමටත්, එම ප්‍රමාණය ඉක්මවා භාවිතයට ගනු ලබන පුටු සඳහා ගාස්තු අය නොකිරීමටත් එසේම නගර ශාලාවෙන් බැහැර ගෙනයෑම සඳහා එක් පුටුවකට රු. 5 0 බැගින් අයකිරීම සුදුසු බවටත්, අවමඟුල් උත්සව සඳහා නොමිලේ ලබාදීම සුදුසු බවටත්, බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ජේ. හේරත්,
නාගරික කොමසාරිස්,
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2013 ඔක්තෝබර් මස 03 වැනි දින,
බණ්ඩාරවෙල මහ නගර සභා කාර්යාලයේ දී ය.

02-791

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.